# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2110/57 - 2019 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2019.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

### දකුණු පළාත් සභාවේ වෙළඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තිය

දකුණු පළාත් වෙළෙඳ අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම මෙහි පළ කරනු ලබන 2019 අංක .......... දරන දකුණු පළාතේ පළාත් සභාවේ වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්ති කෙටුම්පත මෙම ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට සති දෙකක් ඉකුත් වීමෙන් පසු දකුණු පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි.

යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ හැක.

උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,
දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,
වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන,
ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්,
වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 14 වැනි දින,
ගාල්ල,
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය කාර්යාලයේ දී ය.

**2019 අංක ............ දරන දකුණු පළාත් වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තිය**

දකුණු පළාත තුළ සංස්ථාගත කරනු නොලැබූ වෙළෙඳ ස්ථාන විධිමත් කිරීම, එසේ වෙළඳ ස්ථාන පවත්වාගෙන යන ආයතන හා තැනැත්තන් ලියාපදිංචි කිරීම හා ඊට ආනුෂාංගික සියලු කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද දකුණු පළාතේ 1991 අංක 1 දරන ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය 2019 අංක ........... දරන දකුණු පළාතේ වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමතය ලබා දීමෙන් පසු ක්‍රියාත්මක වන්නේ ය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

***I* කොටස**

ව්‍යාපාර ආයතන සහ තැනැත්තන් ලියාපදිංචි විය යුතු ය.

2. (1) දකුණු පළාත තුළ (මෙහි මින්මතු වෙළෙඳ ස්ථාන යනුවෙන් හඳුන්වනු ලබන) සංස්ථාගත කරනු නොලැබූ වෙළෙඳ ස්ථානයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිය ඇතිව ඊට අදාළ සහතිකයක් යටතේ පවත්වාගත යුතු ය.

(2) මෙම වගන්තිය යටතේ වෙළඳ ස්ථානයක් සඳහා ලබාගත් වෙළෙඳ සහතිකය ව්‍යාපාරය පවත්වාගෙන යන පරිශ්‍රය තුළ පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(3) මෙම වගන්තිය යටතේ වෙළඳ ස්ථානයක් ලියාපදිංචි කිරීමට අදාළ කාර්යය පටිපාටිය, දෙන ලද ලියාපදිංචියක් අවලංගු කිරීම හා ඊට අදාළ කාර්යය පටිපාටිය නියම කිරීම, ඊට අදාළවන ආකෘති නියම කිරීම හා ඊට ආනුෂාංගික කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතු ය.

කලින් ලියාපදිංචි කළ ආයතන

3. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනයට පූර්ව දිනයේදී දකුණු පළාතේ 1991 අංක 01 දරන ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයක් ලබාගෙන කරගෙන යන සෑම ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු/තැනැත්තන් මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වූවා සේ සැලකිය යුතු ය. එසේ වුවද මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව සිදු කරනු ලබන වෙනස් කිරීමක් හෝ අවලංගු කිරීමක් මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අනුකූලව සිදු කළ යුතු ය.

ව්‍යාපාර නාම සඳහා භාවිතා නොකළ යුතු වචන

4. (1) ජනාධිපතිවරයා, ජනාධිපති, ජාතික, රාජ්‍ය, ශ්‍රී ලංකා, මුදල්, මූල්‍ය, ................. යන වචන හෝ නාගරික හෝ සංස්ථාගත යන වචන හෝ ඒවායේ සංක්ෂේපයක් නැතහොත් රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව යම් මහා නගර සභාවකට හෝ වෙනත් පළාත් පාලන ආයතනයකට හෝ පාර්ලිමේන්තු පනතකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාගත කරන ලද යම් සමිතියකට, මණ්ඩලයකට හෝ රාජ්‍ය ආයතනයකට සම්බන්ධතාවයක් හඟවන හෝ හැඟවීමට ඉඩ ඇති වචන හෝ සමුපකාරය, සංස්ථාව යන වචන හෝ ඓතිහාසික හෝ සංස්කෘතික වශයෙන් උරුමයන් සඳහා වන වචන හෝ ජාති, ආගම්, කුල, හැඳින්වෙන නාම හෝ ඒ ආශ්‍රිත වචන හෝ එම අදහස හැඟවෙන වචන සහ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් විසින් භාවිතා නොකළ යුතු යැයි නිශ්චය කරනු ලබන වචන ඇතුළත් වන්නා වූ වෙළෙඳ සහතිකයක් ඉල්ලුම් කළ නොහැක.

(2) වෙළෙඳ සහතිකයක ස්වභාවය කරණ කොට ගෙන හෝ එය ප්‍රයෝජනයට යොදවන ආකාරය කරණකොට ගෙන, එය සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි වන්නේ නම් සහ ඉන් යම් ජන කොටසකට ආගමික හෝ වාර්ගීය හැඟීම් රිදවීමකට ඉඩ ඇති නම් හෝ මහජනතාව නොමග යැවීමට ඉඩ ඇති නම් හෝ දැනටමත් එම ව්‍යාපාරය දකුණු පළාත තුළ හෝ සමාගම් නීතිය යටතේ ලබාගෙන ඇති නාමයක් වන විටෙක ඒ සඳහා ඉල්ලුම් නොකළ යුතු ය.

සංශෝධන

5. (1) ව්‍යාපාරයේ ස්වභාවය, හෝ ව්‍යාපාර ස්ථානය වෙනස් කිරීමක් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සිදු කළ හැකි ය.

(2) ව්‍යාපාර හිමිකාරිත්වය වෙනස් වීමේදී පහත පරිදි ක්‍රියා කළ යුතු ය.

(අ) ව්‍යාපාර හිමිකරු ජීවතුන් අතර සිටින අවස්ථාවලදී.
වෙළෙඳ සහතිකය හිමි පුද්ගලයා දිවුරුම් ප්‍රකාශයක් මඟින් තම කැමැත්ත ප්‍රකාශ කරන අවස්ථාවක, අදාළ ව්‍යාපාරය තමාගේ නමින් සංශෝධනය කිරීමට අළුතින් ඉදිරිපත් වන හිමිකරුගේ කැමැත්ත සහිත ලිපිය.

(ආ) ව්‍යාපාරයේ හිමිකරු මිය ගිය අවස්ථාවක දී

(i) හිමිකරු විවාහකයෙකු නම්,
නීත්‍යානුකූල කලත්‍රයා හා වයස අවුරුදු 18ට වැඩි දරුවන් සිටී නම් ඔවුන්ගේ එකඟතාවය මත හිමිකාරිත්වය පැවරිය හැක. (අදාළ එකඟතාවය දිවුරුම් ප්‍රකාශ මඟින්)

වයස අවුරුදු 18ට අඩු දරුවන් සිටීනම්, නිත්‍යානුකූල කලත්‍රයා වෙත හිමිකාරිත්වය පැවරිය හැක. (කලත්‍රයාගේ ලිඛිත ඉල්ලීමක් අනුව)

(ii) හිමිකරු අවිවාහක නම්,

මව, පියා හා වයස අවුරුදු 18ට වැඩි සහෝදර සහෝදරියන්ගේ එකඟතාවය මත (අදාළ එකඟතාවය දිව්රුම් ප්‍රකාශ මඟින්).

(3) (1) ඉහත (i) හා (ii) අවස්ථා දෙකෙහිදීම අදාළ ඉල්ලීම අනුව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වෙතින් වාර්තාවක් කැඳවා අනතුරුව සංශෝධනය කිරීම සුදුසු වේ.

(3) (2) ඉහත (i) හා (ii) අවස්ථාවලදී සිදු කරනු ලබන සංශෝධනය අදාළ දේපළ සම්බන්ධයෙන් අධිකරණය විසින් ගනු ලබන තීන්දුවකට යටත් වන අතර එහිදී ලබා දෙන අධිකරණ තීන්දුව අනුව ව්‍යාපාර හිමිකම වෙනස් විය හැක.

(4) හවුල් ව්‍යාපාරයට අලුත් හවුල්කරුවකු ඇතුළත් වනවිට සංශෝධන අයදුම්පතක් මඟින් ඉල්ලීම සිදු කළ යුතු ය. හවුල්කරුවන් 2 ට වඩා වැඩි ප්‍රමාණයක් සිටින විට එක් හවුල්කරුවෙකු හෝ ඊට වැඩි දෙනෙකුට ඉවත් වීමටත්, නව හවුල්කරුවන්ට ඇතුළු වීමටත් හැකිය. හවුල්කරුවන් දෙදෙනෙකු පමණක් සිටින විට එක් හවුල්කරුවෙකු ඉවත් වන විට හවුල් ව්‍යාපාරය අවලංගු කර ඉතිරි පුද්ගලයාට තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කළ හැකිය.

(5) තනි පුද්ගල ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරයක් බවට පත් කිරීම.

මේ සඳහා තනි පුද්ගල ව්‍යාපාරය හිමිකරුගේ හා අනෙක් හවුල්කරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ මඟින් කැමැත්ත ලබා ගෙන අදාළ පරිවර්තනය කළ හැක. එහිදී හවුල් ව්‍යාපාරයේ ආරම්භක දිනය වන්නේ ලිපි ලේඛන කාර්යාලය වෙත භාර දෙන දිනය වේ.

(6) හවුල් ව්‍යාපාරයන් තනි පුද්ගල ව්‍යාපාරයක් බවට පත් කිරීම

සියළු හවුල්කරුවන්ගේ කැමැත්ත දිවුරුම් ප්‍රකාශ මගින් ලබා දිය යුතු ය. එහිදී තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස තව දුරටත් ව්‍යාපාරය කරගෙන යෑමට අදාළ වූ කැමැත්ත ද සඳහන් කර තිබිය යුතු ය. (ඉවත් වන හවුල්කරුවන්ගේ ඉවත් වීමත් තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස කරගෙන යාමත් සඳහන් විය යුතු ය. තවද තනි පුද්ගල ව්‍යාපාරය ලෙස භාර ගන්නා පුද්ගලයාගේ ඒ සඳහා කැමැත්ත ද දිවුරුම් ප්‍රකාශයක් මගින් පැහැදිලිව සඳහන් කළ යුතු ය.)

(7) කෙසේ වුවත් ඉහත සංශෝධන කිරීමේදී ඒවා පහත කොන්දේසි සපුරාලීමට යටත්ව සිදුකළ යුතු ය.

(අ) තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාරයේ නාමය මුළුමනින්ම සංශෝධනය කිරීම නොකළ යුතු ය.
(ආ) ව්‍යාපාර ස්වභාවය කැපී පෙනෙන සංශෝධනයක් කිරීම නොකළ යුතු ය.
(ඇ) තනි පුද්ගල ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්නේ නම්, තනි පුද්ගල ව්‍යාපාරයේ අයිතිකරු හවුල් ව්‍යාපාරයේ ද හවුල්කරුවෙක් විය යුතු ය.
(ඇ) හවුල් ව්‍යාපාරයක් තනි පුද්ගල ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්නේ නම්, හවුල් ව්‍යාපාරයේ අයිතිකරුවන්ගෙන් අයෙක් තනි පුද්ගල ව්‍යාපාරයේ අයිතිකරු විය යුතු ය.

## *II* කොටස

### පත් කිරීම්, ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය

රෙජිස්ට්‍රාර්වරයා පත් කිරීම සහ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය

6. (1) පළාත් වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා (මෙහි මින් මතු රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් හඳුන්වනු ලබන) පළාත් වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයෙක් පත් කරනු ලැබිය යුතු ය. මේ සඳහා දකුණු පළාත් සභාවේ වෙළෙඳ විෂය හිමි අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් පළාත් වෙළෙඳ වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා ලෙස පත්වීම් ලබයි.

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පළාත තුළ වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ සාමාන්‍ය පාලනය හා අධීක්ෂණය රෙජිස්ට්‍රාර්වරයා සතු වන්නේ ය.

බලතල පැවරීම

7. මෙම ප්‍රඥප්තිය, රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල, කාර්ය හෝ කර්තව්‍ය, රෙජිස්ට්‍රාර්වරයාගේ අධිකාරිය හෝ පාලනය යටතේ, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා බලයලත් නිලධාරියෙකු වෙත පැවරිය හැකිය. එනම් ප්‍රාදේශීය ලේකම් හෝ වෙනත් යම් නිලධාරියෙකු වෙත බලය පැවරිය හැකි අතර ප්‍රාදේශීය ලේකම් හෝ ඔහු වෙනුවෙන් කාර්යය හා කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධාරියාට අදාළ සහතිකයේ ස්වකීය අත්සන යොදා සහතික නිකුත් කිරීම කළ හැකි ය.

රෙජිස්ට්‍රාර්වරයා වෙත විස්තර සැපයීමේ කාර්ය

8. (1) යම් තැනැත්තකු හෝ ඒ තැනැත්තා හවුල්කරුවකු වන ව්‍යාපාර ආයතනය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ යුතු ද නැද්ද යන්න හෝ ලියාපදිංචි කළ විස්තර වල වෙනසක් කළ යුතුද යන්න දැන ගැනීම සඳහා අවශ්‍ය යැයි තමාට පෙනෙන විස්තර තමා විසින් නියම කරනු ලබන කාලය තුළ තමා වෙත සපයන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, ඒ විස්තර සපයන ලෙස එහි ලේකම්වරයාට හෝ ලේකම්වරයාගේ කාර්ය ඉටු කරන සංස්ථාවේ වෙනත් යම් නිලධරයකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන විස්තර රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරන කාලයක් ඇතුළත හෝ ඔහු විසින් තවදුරටත් ඉඩ දිය හැකි කාලයක් තුළ සැපයීම් නොකරන යම් තැනැත්තෙකු හෝ සත්‍ය නොවන විස්තර සපයන යම් තැනැත්තකු වරදක් කරන අතර, ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු එසේ අතපසු කිරීම නොකඩවා කර ගෙන යනු ලැබූ එක් එක් දිනකට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී අධිකරණය විසින් කරනු ලබන ආඥාවේ නිශ්චිත ලෙස සඳහන් කරනු ලබන විස්තර ආඥාවේ සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයන හෝ සැපයීමට සලස්වන ලෙස ඒ තැනැත්තාට ආඥා කිරීම සුදුසු යැයි අධිකරණය අදහස් කරන අවස්ථාවක අධිකරණය විසින් එසේ ආඥා කළ හැකි ය.

(4) යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාරයක් ලියාපදිංචි කළ යුතු බව හෝ ලියාපදිංචි කර ඇති විස්තරවල වෙනසක් කර ඇති බව එසේ සපයන ලද යම් තොරතුරකින් රෙජිස්ට්‍රාර්වරයාට පෙනී ගියහොත් ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට ඉඩ දෙනු ලබන කාලයක් තුලදී තමාට අවශ්‍ය කරනු ලබන විස්තර සපයන ලෙස ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට ඔහු විසින් නියම කරනු ලැබිය හැකිය.එහෙත් මේ ප්‍රඥප්තිය යටතේ යම් පැහැර හැරීමක් කර ඇති බව මේ වගන්තිය යටතේ ලබා ගත් තොරතුරුවලින් අනාවරණය වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ යම් කාලයක් ඇතුළත තමා වෙත සපයන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට දන්වා ඇති විටක, ඒ කාලය ඉකුත් වීමට පෙර, තැනැත්තාට විරුද්ධව ප්‍රඥප්තිය යටතේ නඩු කටයුතු ආරම්භ නොකළ යුතුය.

(5) මෙම ප්‍රඥප්තිය යටතේ සහතිකලත් වෙළෙඳ ව්‍යාපාරයක් එහි ව්‍යාපාරික ස්වභාවය,ස්ථානය හෝ අයිතිය වෙනස්වන සෑම අවස්ථාවකදීම එසේ වෙනස්වීම සිදුවී මාසයක් ඇතුලත මෙම ප්‍රඥප්තිය යටතේ දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඉල්ලුම් කර ඊට අදාල සහතිකය ලබාගත යුතුය.

සෝදිසි කර බැලීමේ බලය

9. (1) මේ ප්‍රඥප්තිය යටතේ කාර්ය ඉටු කිරීම පිණිස තමාට අවශ්‍ය තොරතුරු තමා වෙත සපයනු නොලැබීමට ඉඩ ඇති බව තමා අදහස් කරන්නේ නම් හෝ ඒ තොරතුරු යටතේ කරනු ඇතැයි තමා සැක කරන්නේ නම්, ඒ තොරතුරු ලබා ගැනීමේ කාර්යය සඳහා සෝදිසි කර බලා රෙජිස්ට්‍රාර්වරයා නියම කරන තොරතුරු ලබා ගන්නා ලෙස තත් කාර්යය සඳහා පත් කර ඇති නිලධරයකුට රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් බලය පැවරිය හැකි අතර, ඒ බලය පැවරීම තත් කාර්යයට අදාලව තබා ගෙන පවත්වාගෙන යන ලේඛණයේ සටහන් කරනු ලැබිය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ යම් තොරතුරක් දැන ගැනීමේ කාර්යය (i) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් විශේෂයෙන් බලය පවරනුලැබූ යම් නිලධරයකු විසින්, අවශ්‍ය නම්, සාම නිලධරයකු ද කැටුව යා හැකි අතර පහත දැක්වෙන ක්‍රියා අතුරින් යම් ක්‍රියාවක් හෝ ඒ ක්‍රියා සියල්ලක් ම හෝ සිදු කරනුලැබිය හැකිය.

(අ) යම් තැනැත්තකුට හෝ ව්‍යාපාර ආයතනයකට අයිති වන යම් පොත්, ලේඛන හෝ වෙනත් ලියකියවිලි යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක තිබිය හැකි බවට තමාට විශ්වාස කිරීමටතොරතුරු ඇති විටක, ඒ ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ඇතුල් වී පරීක්ෂා කිරීම සහ ඒ පොත්,ලේඛන හෝ ලියකියවිලි පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කරනු ලැබීමට සැලැස්වීම:

(ආ) යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පරීක්ෂා කරන අතරතුරදී හමුවන යම් පොතකින්,ලේඛනයකින් හෝ ලියවිල්ලකින් සටහන් කර ගැනීම, ඉන්වෙන්ටරියක් සකස් කිරීම හෝ උධෘතයන් ගැනීම.

(ඇ) ඒ ගොඩනැගිල්ල හෝ ස්ථානය තුළ සිට ඔහුට හමුවන යම් තැනැත්තෙකුගෙන්, මේ ප්‍රඥප්තියට අදාළ වන්නා වූ හෝ ඒ යටතේ වූ යම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම; මේ වගන්තිය යටතේ කරනු ලබන සෝදිසි කිරීම් වලට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සෝදිසි කිරීම්වලට අදාළ විධිවිධානම හැකිතාක් දුරට අදාළ විය යුතුය;

(ඈ) යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් සෝදිසි කර බලන අතරතුර හමුවන යම් පොතක්, ලේඛනයක් හෝ වෙනත් ලියවිල්ලක් ඉවතට ගෙන යාම සහ එය ඉවත් කර ගන්නා ලද්දේ යම් තැනැත්තකුගේ භාරකාරත්වයෙන්ද ඒ තැනැත්තාට ඒ වෙනුවෙන් ලදුපතක් නිකුත් කිරීම සහ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලේඛනයෙහි ඒ පොත්, ලේඛන හෝ වෙනත් ලියකියවිලි පිළිබඳ විස්තර අප්‍රමාදව ඇතුළත් කිරීම.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලක් මඟින් විශේෂයෙන් බලය පවරන ලද යම් නිලධරයකු විසින් නියම කරනු ලැබූ අවස්ථාවක එසේ යම් තොරතුරක් සැපයීමට හෝ යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට හෝ අපොහොසත් වන්නා වූ ඉහත සඳහන් විධිවිධාන යටතේ යම් පරීක්ෂා කිරීමක් කරගෙන යාමට බාධා කරන හෝ ඉඩදීමට අපොහොසත් වන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක්, සංස්ථාවක්, අනුයෝජිතයෙක්, අධ්‍යක්ෂවරයෙක් නිලධරයෙක් හෝ එවැනි ව්‍යාපාර ආයතනයක හෝ තැනැත්තකුගේ සේවා නියුක්තයෙක්, වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඔහු විසින් ඔප්පු කරන්නේ නම් මිස, වරදකට වරදකරු විය යුතුය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් වරදකට මේ ප්‍රඥප්තිය යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තා,හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක, වරද සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඒ හවුල් ව්‍යාපාරයේ වූ හවුල් ව්‍යාපාරකරුවෙකු හෝ කළමනාකරුවකු වූ සෑම තැනැත්තෙකුම ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු මාස දොළහක් නොඉක්මවන්නා වූ කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් විසි පන්දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙයාකාරයෙන්ම වූ දඬුවමකට යටත් කරනු ලැබිය යුතුය.

(5) ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි දීර්ඝකර ගැනීමකදී හෝ නව ලියාපදිංචියක් ලබා ගැනීමේදී පූර්වයෙන් පැවති ලියාපදිංචි අංකයක් යටතේ සහතිකයක් නිකුත් කිරීමට බාධාවක් නොවිය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රකාශන ගොනු කිරීම සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සහ නාම පුවරුවක් හා අංකය ප්‍රදර්ශනය කිරීම කළ යුතු බව

10. (1) මේ ප්‍රඥප්තිය ප්‍රකාර යම්වෙළෙඳ ව්‍යාපාරයක්ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් අතිරේක වූ ප්‍රකාශයක් ඉල්ලුම්කරු වෙතින් ඉල්ලා සිටින්නේනම් ඊට අදාල අතිරේක වූ ප්‍රකාශය නියමිත කාලය තුල ඉල්ලුම්කරු විසින් ඉදිරිපත්කල යුතු අතර එය ඊට අදාල ගොනුවට ඇතුලත් කර තැබීමට සැලැස්විය යුතුය.එසේම ඒ මත සෑහිමට පත්වන අවස්ථාවකදී වෙළෙඳ ස්ථානය ලියාපදිංචි කිරීමට අදාල සහතිකය ඉල්ලුම්කරු වෙත භාර දීම හෝ ලියාපදිංචි තැපැල් මඟින් යැවීම හෝ කළ යුතුය;

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින්, එය ලැබී දින දහහතරක් ඇතුළත, ඒ සහතිකය හෝ එහි සහතික කරන ලද පිටපතක් ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ සහ ව්‍යාපාරය කර ගෙන යන සෑම ස්ථානයකම ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තෙකුම හෝ ව්‍යාපාර ආයතනයක්ම විසින්,

(අ.) සිය ලිපි ශීර්ෂවල :-

(i) තැනැත්තකු විසින් කරගෙන යන්නා වූ (හවුල්කරුවන්ගෙන් එක් හවුල්කරුවකුවත් සංස්ථාවක නොවන) ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් විසින් පවත්වාගෙන යන්නා වූ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විටක, වෙළෙඳ සහතිකය සහ ව්‍යාපාරය කරගෙන යන්නා වූ පුද්ගලයාගේ නම හෝ සියහවුල්කරුවන්ගේ නම් සහ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සහ ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය;

(ii) (හවුල්කරුවන්ගෙන් එක් අයකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සංස්ථාවක් වන) ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් විසින් කරගෙන යන්නා වූ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විටක, ලියාපදිංචි කළ වෙළෙඳ සහතිකය, තැනැත්තකු වන්නා වූ හවුල්කරුගේ හෝ තැනැත්තන් වන්නා වූ හවුල්කරුවන්ගේ නම හෝ නම් සහ සංස්ථා නාමය සහ සංස්ථා වන සියහවුල්කරුවන්ගේ සංස්ථාගත කිරීමේ විස්තර සහ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සහ ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය;

(ආ) සිය ලදුපත්වල සහ ඉන්වොයිස්වල :-

(i) ව්‍යාපාරයේ නාමය; සහ

(ii) ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සඳහන් කරනු ලැබිය යුතුය.

(4) (2) වන උපවන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවහොත්,එසේ පැහැර හැරීම කරන සෑම තැනැත්තකුම හා ඒ තැනැත්තා ව්‍යාපාර ආයතනයක හවුල්කරුවකු නම්,ඒ ව්‍යාපාරආයතනයේ සෑම හවුල්කරුවකුම වන හවුල් ව්‍යාපාරිකයෙකුම හෝ ඊට අදාල කළමනාකරුවකු හෝ භාරකරුවෙකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්අධිකරණයක් විසින් ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය.

(5) යම් ප්‍රකාශයක් ලියාපදිංචි කිරීම හෝ ඒ ලියාපදිංචි කිරීම වෙනුවෙන් වූ සහතිකය හෝ ඒ ප්‍රකාශය සපයන තැනැත්තාට එරෙහිව හැර, ඒ ප්‍රකාශයෙහි සඳහන් කරුණු පිළිබඳ සත්‍යතාව සම්බන්ධයෙන් බැලුබැල්මට පෙනෙන හෝ අන්‍යාකාර කරුණු වශයෙන් තේරුම් නොගත යුතුය.

අවසන් කිරීමේ දැන්වීම සහ ලේඛනයේ නාමය ඉවත් කිරීම

11. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ව්‍යාපාරික ආයතනයක් විසින් හෝ තැනැත්තකු විසින් ස්වකීය ව්‍යාපාර කටයුතු වෙළෙඳ සහතිකය යටතේ කරගෙන යාම නතර කරනු ලැබුවහොත්, එසේ නතර කරන ලද අවස්ථාවේ සිට මාස තුනක් ඇතුළත, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් ඒ වෙළෙඳ සහතිකය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම අවසාන කර ඇති බවට නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත තැපැල් මඟින් යැවීම හෝ භාර දීම සිදු කළ යුතුය. ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කරන ලද අවස්ථාවේදී, ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන් වූ තැනැත්තන්ගේ හෝ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තා මියගොස් ඇති විට ඔහුගේ පෞද්ගලික නියෝජිතයන් මෙම වගන්තිය යටතේ වූ කාර්යය සිදුකල යුතුය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කරන ලද ප්‍රකාශය දීම ස්වකීය කාර්යයව තිබුණු යම් තැනැත්තකු විසින් ඉහත කී කාලය ඇතුළත දී එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, ඔහු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන අතර, එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට;රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීම ලැබුණු පසු රෙජිස්ට්‍රාර්වයා විසින් එය ගොනු කර තැබිය යුතු අතර, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ලියාපදිංචි කිරීම ලේඛනයන් ඉවත් කරමින් ලේඛනයෙහි සටහන් කළ යුතුය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ලියාපදිංචි කළ වෙළෙඳ ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයන බව විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වයාට සාධාරණ හේතු ඇති විටෙක,

(අ) ලියාපදිංචි තැපෑලෙන් යැවෙන නිවේදනයක් හෝ පුවත්පත් යටතේ පල කරනු ලබන දැන්වීමක් මඟින් එම වෙළෙඳ ව්‍යාපාරයේ ලියාපදිංචිය අවලංගු නොකිරීමට හේතු ඇතොත් මාසයක් ඇතුලත දැනුම් දෙන ලෙසට නියම කල හැකි අතර එසේ සාධාරණ විරෝධතාවක් නියමකරන ලද දිනයට දැනුම්දීම නොකලහොත් අදාල වෙළෙඳ ව්‍යාපාරයේ ලියාපදිංචිය අවලංගු කරජ් බව දැන්වීමට ක්‍රියාකල යුතුය. දැන්වීම පළ කිරීමෙන් මාසයක්ඇතුළත තමා වෙත විරෝධතා නොලැබුණහොත්, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ නාමය ලේඛනයෙන් ඉවත් කරන බව සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළකිරීමට ; හෝ

(ආ) ඒ දැන්වීමේ පිටපතක් ඒ දැන්වීමෙහි සඳහන් ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට සහ එක් එක් හවුල්කරුවාට ඔහුගේ වාසස්ථානයේ ලිපිනයට, ලියාපදිංචි කළ තැපැලෙන් නොපමාව යැවීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

(5) එකී දැන්විම යවනු ලැබීමෙන් පසු එක් මාසයක් ඇතුලත, එකී දැන්වීම පිළිබඳ විරෝධතාවයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත නොලැබුණහොත්, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ නාමය ඔහු විසින් ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට ඇති බලය

12. (1) යම් වෙළෙඳ ස්ථානයක් ලියාපදිංචි කිරීම,මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීතීන්හි සඳහන් විධි විධානයන්ට පටහැනිව ඉල්ලුම් කර ඇති විටෙක අදාල ලියාපදිංචිය ලබා දීම රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කල යුතුය

(2) මේ ප්‍රඥප්තිය යටතේ වෙළෙඳ ස්ථානයක්ලියාපදිංචි කිරීමට පරිබාහිරව, එය භාවිතා කිරීම තහනම් කරනු ලැබිය හැකි නම්, එය භාවිතා කිරීමට ඒ ලියාපදිංචි කිරීම මඟින් බලය දෙන ලෙස තේරුම් නොගත යුතුය.

ප්‍රතික්ෂේප කරන ලද හෝ අවසන් කරන ලද ව්‍යාපාරනාමයක් භාවිතා කිරීම සඳහා දණ්ඩනය

13. මේ ප්‍රඥප්තිය යටතේ වෙළෙඳ සහතිකයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ අවසන් කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යාපාරය දිගටම කරන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු වරදක් කරන සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට ලසු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට සහ වරද කරනු ලැබීමෙන් පසු දිගටම කරනු ලබන සෑම දිනයක් සඳහාම රුපියල් පන්සීයක අඛණ්ඩ දඩයකට ඔහු යටත් විය යුතුය.

අභියාචනා

14. මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ගන්නා ලද යම් තීරණයකින් හෝ කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණය හෝ නියමය තමා වෙත ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසු විෂය භාර අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකිය.අමාත්‍යවරයා විසින් අභියාචනයක් ලැබී තුන් මසක් ඇතුලත ඔහුගේ තීරණය ප්‍රකාශයට පත් කළ යුතුය. එකි තීරණය අවසානාත්මකතීරණය විය යුතුය.

ලියාපදිංචි කරන ලද ප්‍රකාශ පරික්ෂා කිරීම සහ සහතික කළ පිටපත් නිකුත් කිරීම

15. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් ගොනු කර තබා ඇති ලේඛන, නියම කරනු ලබන ගාස්තු ගෙවා, යම් තැනැත්තකු විසින් තම ව්‍යාපාරය සම්බන්ධවපරික්ෂා කර බලනු ලැබිය හැකිය.

(2) යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ යම් නියමිත ආකෘතියක කරන ලද යම් ප්‍රකාශයක පිටපතක් හෝ උධෘතයක් රෙජිස්ට්‍රාර්වරයා ලවා සහතික කරවා ගැනීම පිණිස තම ව්‍යාපාරය සම්බන්ධවයම් තැනැත්තකු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකිය. ඒ සහතිකය සහතික කරන ලද පිටපත හෝ උධෘතය සඳහා නියම කරනු ලබන ගාස්තුව ගෙවිය යුතුය.

(3) ලියාපදිංචි කිරිමේ සහතිකයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සපයන ලද හෝ ලියාපදිංචි කරන ලද ප්‍රකාශයක පිටපතක් හෝ ඡායාස්ථිතික පිටපතක් හෝ උධෘතයක්, එය සත්‍ය පිටපතක් බවට රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සනින් යථා පරිදි සහතික කොට තිබේ නම්,එයසාක්ෂිමය ආවේශනයකට යටත් ලේඛනයක් වශයෙන් සැලකිය යුතුය.

යම් වාර්තා ලේඛනයක වෙළුමක හෝ ලිපිගොනුවක වූ යම් වෙළෙඳ සහතිකයක් නැති වී හෝ හානි වී හෝ විනාශ වී ඇති බවට හෝ එහි ඇති සටහන් හෝ ඒ සටහන් වල යම් වැදගත් කොටසක් කියවීමට නොහැකි වන පරිදි මැකී ගිය බවට හෝ හානියට පත් වී ඇති බවට නිසි පරීක්ෂණයකින් පසු රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වූ අවස්ථාවකදී සකස් කළ වෙළෙඳ සහතිකයක් ඒ වෙනුවෙන් නිකුත් කිරීමට හැකිය.

දැන්වීම් භාර දීම

16. මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දීමට හෝ භාර දිමට නියම කරනු ලැබ ඇති යම් දැන්වීමක්, ලිඛිත නිවේදනයක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක්, එය අමතනු ලැබ තැනැත්තාගේ ලියාපදිංචි කළ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය වෙත ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කළ තැපැලෙන් යවා ඇත්තේ නම්, එය යථා පරිදි දී ඇති ලෙස හෝ භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

අයදුම්පත්‍රයක් අහෝසි වන අවස්ථා

17. (1)ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වෙළෙඳ ව්‍යාපාර සහතිකයක් අයදුම්කර ඇති අවස්ථාවක ඊට අදාල සහතිකය නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාවිසින් ලියවිල්ලකින් නියම කරනු ලැබූ විස්තර සැපයීම හෝ ඔහු විසින් නියම කරනු ලැබූ යම් සංශෝධන මුල් ඉල්ලීමෙහි ඇතුළත් කිරීම පැහැර හැරී අවස්ථාවක, එකී විස්තර හෝ සංශෝධන ඉල්ලීමෙහි ඇතුළත් කරන ලෙසට නියමිත ආකෘතියෙන් වූ දැන්වීමක් එම තැනැත්තාට

හෝ ව්‍යාපාර ආයතනයට රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය; එසේ නිකුත් කිරීමේ දින සිට එක් මාසයක කාලයක් ඇතුලත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් දෙනු ලබන ඊට වැඩි කාලයක් ඇතුළත ඒ තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් එම දැන්වීමෙහි සඳහන් කරුණු ඉටු කිරීම පැහැර හරිනු ලැබුවහොත්, එම ඉල්ලීම අහෝසි වූ ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලැබිය හැකි අතර, ඒ මත සහතිකයක් නිකුත් කිරීම සඳහා තව දුරටත් ක්‍රියා නොකර සිටිය හැකිය;

එසේ වුවද, මුල් ඉල්ලීම මත නියම කරනු ලබන වැඩිමනත් ගාස්තුවක් ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් ගෙවනු ලබන්නේ නම් සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබූ ඒ විස්තර සපයන්නේ නම් හෝ ඔහු විසින් නියම කරනු ලැබූ සංශෝධනය මුල් ඉල්ලීමෙහි ඇතුළත් කරන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ අහෝසි වූ ඉල්ලීම මත තව දුරටත් ක්‍රියා කරනු ලැබිය හැකිය.

(2) මෙම වගන්තිය යටතේ අහෝසි වූ වෙළඳ සහතිකයන් පාවිච්චි කිරීම, අඛණ්ඩව කරගෙන යන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට පියවර ගෙන නොමැති නම්, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හා වරදකරු කරනු ලැබීමෙන් පසු වරද අඛණ්ඩව කරගෙන යනු ලබන දිනයක් සඳහා රුපියල් එක් සියයක අඛණ්ඩ දඩයකට ද ඔහු යටත් විය යුතුය.

රීති මගින් ගාස්තු නියම කිරීම

18. (1) මෙම ප්‍රඥප්තිය යටතේ වෙළෙඳව්‍යාපාරයක්ලියාපදිංචි කිරීම,ලියාපදිංචියක් දීර්ඝ කිරීම ඊට අදාල සහතිකය නිකුත් කිරීම හා වෙනත් ඕනෑම ප්‍රකාශයක් උද්ධෘතයක්,වාර්තාවක් ඇතුළු ලේඛනයක් ප්‍රඥප්තිය යටතේරෙජිස්ට්‍රාර්වරයා විසින් සිදු කරනු ලබන වෙනත් කවර හෝ සේවාවක් වෙනුවෙන් අයකල යුතු ගාස්තු මෙම ප්‍රඥප්තිය යටතේඅමාත්‍යවරයා විසින්රීති මඟින් නියම කරනු ලබන ආකාරයට විය යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේරෙජිස්ට්‍රාර්වරයාගේ බලය අභිනියෝජනය කිරීම මත කාර්යය කටයුතු පවත්වාගෙන යන බලයලත් නිලධාරින් වෙත එසේ කරනු ලබන කාර්යය කටයුතු සම්බන්ධයෙන් සුදුසු පාරිශ්‍රමික දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය මත දකුණු පළාත් අමාත්‍ය මණ්ඩලය අනුමත කරන පරිදි ගෙවිය හැකිය.

19. (1) රීති මඟින් නියම කරනු ලබන ආකාරයට විය යුතු යැයි මෙම ප්‍රඥප්තිය යටතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ රීති සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ සඳහන් දින සිට හෝ එහි සඳහන් ඉදිරි දිනයක සිට බලාත්මක විය යුතු අතරඑසේ බලාත්මක වී මාස 03 ක් ඇතුලත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කල යුතුය.

(3) එසේ පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් රීතියක් පරිච්ඡින්න වූවාසේ සැලකිය යුතු අතර එහෙත් ඒ යටතේ එතෙක් ගන්නා ලද කවර හෝ ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි පරිච්ඡින්න වූවාසේ සැලකිය යුතුය.

(4) යම් රීතියක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

අසත්‍ය ප්‍රකාශ හෝ වෙළඳ සහතිකය ලියාපදිංචි කරනු ලැබූ බවට අසත්‍ය ලෙස කරුණු දැක්වීම සම්බන්ධයෙන්

20. (1) (අ) වෙළෙඳ ස්ථානයක් ලියාපදිංචි කර නොමැතිව තිබියදී දැන දැනම එය ලියාපදිංචි කර ඇති බවට කරුණු දක්වන හෝ ලියාපදිංචි සහතිකයේ ලියාපදිංචි අංකය දැන දැනම වෙනස් කරන,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ යම් ප්‍රකාශයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් අසත්‍ය ලෙස ඉදිරිපත් කරන හෝ දෙන හෝ ඉදිරිපත් කිරීමට හෝ දීමට සලස්වන;

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිටදී ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ ඔහු යටත් විය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතානුසාරී බලය

21. මේ ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ සාදන ලදරීතියකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත අභිමතානුසාරී බලතල පවරා දී ඇති අවස්ථාවකදී ආවේදිත පාර්ශ්වයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසා දී ඇති වුවද, රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑම විටම තමන්ගේ බලතල අභිමතයපරිදි ක්‍රියාත්මක කිරීම සද්භාවයෙන් කළ යුතුය.

22. මේ ප්‍රඥප්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තබාගනු ලබන ලියාපදිංචි කිරීමේ සටහනක කලින් කල සොයාගනු ලබන යම් ලිපි දෝෂයක්.. රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලබන පරීක්ෂණයකින් පසු ඔහු විසින් නිවැරදි කළ හැකිය. ලිපි දෝෂ නිවැරදි කිරීම

23. මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද හෝ ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට එරෙහිව නඩුවක් හෝ වෙනත් නීති කෘත්‍යයක් නොපැවරිය යුතුය. නොපැවැත්විය යුතුය. රෙජිස්ට්‍රාර්වරයාට විරුද්ධව නඩු පැවරීමට නොහැකි බව

24. රෙජිස්ට්‍රාර්වරයා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ එකී කාර්යයසිදුකරනු ලබන යම් තැනැත්තෙක්, එකී ධූරය දරන තාක්කල්, දණ්ඩ නීතිසංග්‍රහයේඅර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා සහ අනෙකුත් සේවකයින් රජයේ සේවකයන් බව

25. මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ තබා ගැනීමට හා පවත්වා ගෙන යාමට නියමිත සියලු වාර්තා ලේඛන, රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ බලය පවරන නිලධාරියාගේ අධීක්ෂණය යටතේ,ලියාපදිංචි කාර්යාලයේ තබා ගැනීම හා පවත්වාගෙන යාම කල යුතු ය. වාර්තා ලේඛන ආදිය පවත්වාගෙන යාම

26. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් දකුණු පළාතේ 1991 අංක 01 දරන දකුණු පළාතේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර එම ප්‍රඥප්තිය යටතේ පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් යටතේ පවත්වාගෙන යන හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු යටතේ පවත්වාගෙන යනු ලැබූ සියලු ලේඛන මෙම ප්‍රඥප්තිය යටතේ වන රෙජිස්ට්‍රාර්වරයාගේ භාරයේ ඇති ලේඛන වශයෙන් සලකා කටයුතු කල යුතුය. අන්තර් විධිවිධාන

(2) 1991 අංක 01 දරණ දකුණු පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන සහතිකයක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවන දිනට පසුව එළඹෙන අනුගාමී මුදල් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා කාලසීමාවට අදාල වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන වෙළෙඳ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් වශයෙන් අවශ්‍ය පමණට සැලකිය යුතුය.

(3) එකී ප්‍රඥප්තිය යටතේ යම් අධිකරණයක නියමිත දිනයට පෙරාතුව වූ දිනයක විනිශ්චයට භාජනව පවත්නා නීති කෘත්‍යය, එම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ විභාග වන අතර ඒ යටතේ අර්ථ නිරූපනය කල යුතුය.

27. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"වෙළෙඳ ව්‍යාපාරය" යන්නට මුදල් හුවමාරුවක් සිදුවන යම් වෙළෙඳාමක්, වෘත්තීයක්, සේවාවක් ඇතුලත් වේ.

"ව්‍යාපාර ලියාපදිංචි සහතිකය" යන්නෙන්, තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන්නේ යම් නාමයක් හෝ අභිධානයක් යටතේද ඒ නාමය හෝ අභිධානය අදහස් වන අතර, විලාසමක් ද ඊට ඇතුලත් වේ.

"සංස්ථාව" යන්නෙන්, යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ පිහිටුවන සංස්ථාවක් අදහස් වන අතර, සමාගම් වලට අදාල නීතියෙන් කථනය කරනු ලැබ ඇති සමාගමක්ද ඊට ඇතුලත් වේ.

"අධ්‍යක්ෂවරයා" හා "ලේකම්වරයා" යන්නට, කවර හෝ නමකින් හඳුන්වනු ලබන, අධ්‍යක්ෂවරයාගේ හෝ ලේකම්වරයාගේ තත්ත්වය දරනු ලබන තැනැත්තකු ඇතුලත් වේ.

"ව්‍යාපාර ආයතනය" යන්නෙන්, ලාභය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ අරමුණ ඇතිව එකිනෙකා සමඟ හවුල් ව්‍යාපාරයක් හා බැඳුනු තැනැත්තන් දෙදෙනෙකුගෙන් හෝ ඊට වැඩිසංඛ්‍යාවකින්හෝ තැනැත්තන් එක්කෙනෙකුගෙන් හෝ සමන්විත ව්‍යාපාර ආයතනයක් අදහස් වේ.එහෙත් 2007 අංක 01 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමක් අදහස් නොවේ.

"තැනැත්තා/තැනැත්තන්" යන්නෙන්, ස්වාභාවික තැනැත්තෙකු/තැනැත්තන් අදහස් වේ. (වයස අවුරුදු 18 ට නොඅඩු දකුණු පළාත් සභාව තුල ව්‍යාපාර ස්ථාන ස්ථාපිත කර ඇති තැනැත්තා/තැනැත්තන්.)

"අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාතේ වෙළෙඳ විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

28.මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය ප්‍රමුඛ වි යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

03 - 214

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.